# HSBC ගෙවීම් අත්පත් කරගැනීමේ ක්‍රමවේදය පිළිබඳ වැදගත් තොරතුරු

ණය එකතු කිරීමේ බාහිර ආයතන 05 ක් සමඟ HSBC බැංකුව කටයුතු කරනු ලබයි. අපගේ ගෝලීය මෙහෙයුම් ආකෘතියට අනුකූලව, ‘‘ක්ෂේත්‍රය පිළිබඳව ඇති දැනුම’’ සහ තවත් අවශ්‍යතා මාලාවක් මත පදනම්ව මෙම ආයතන මෙම කාර්යය සඳහා බඳවාගෙන ඇත.

HSBC බැංකුව උසස් මට්ටමේ ප්‍රමිතීන්ට අනුව කටයුතු කරනු ලබන අතර, ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වීමට සියලු පියවර ගනු ලබයි. කරුණු එසේ හෙයින්, එවැනි උසස් ප්‍රමිතීන් උසස් මට්ටමින් පවත්වාගෙන යාම උදෙසා මෙම බාහිර ආයතනයන් වෙත දැඩි ‘‘චර්යා ධර්ම පද්ධතියක්’’ නිකුත් කර ඇත. එසේම, එම ආයතන විසින් සපයනු ලබන සේවාවන් ඇගයුම් ක්‍රියාවලියක් හරහා නිරන්තරයෙන් අධීක්ෂණය කෙරේ. තවද, නියෝජිතයන් වෙත පනවා ඇති සීමාවන් තුළ ඔවුන් රැඳී සිටින බවට සහතික වීම පිණිස, අත්පත් කරගැනීමේ ආචාර ධර්ම විධි පිළිබඳ විවිධ පුහුණු වැඩසටහන් මෙහෙයවීම ද බැංකුව විසින් සිදුකරනු ලබයි.

පහත දක්වා ඇති සේවාවන් ඔබ වෙත සැපයීමට, බලයලත් ආයතනයවල සේවය කරන සියලු නියෝජිතයන්ට හැකියාව ඇත

01. ඔබ විසින් ගෙවීමට නියමිතව ඇති හිඟ ගිණුම සම්බන්ධයෙන් ආපසු ගෙවීමේ සැලසුමක් යෝජනා කිරීම.

02. ගෙවීම් සිදුකිරීමේදී අතරමැදියෙකු වශයෙන් කටයුතු කිරීම.

03. භාෂා තුනෙන්ම කථා කිරීමේ හැකියාව ඇති බැවින්, ඔබ විසින් ගෙවීමට නියමිතව ඇති හිඟ ගිණුම මනාව කළමනාකරණය කරගත හැක්කේ කෙසේද යන්න පිළිබඳව ඔබට උපදෙස් දීම.

අපගේ ණය එකතු කිරීමේ බාහිර ආයතනවල නම් සහ එම ආයතන හා සම්බන්ධ විය හැකි ක්‍රමවේදයන් පිළිබඳ විස්තර ඔබගේ දැනගැනීම පිණිස මීට අමුණා ඇත.

වඩා හොඳ අත්දැකීමක් උදෙසා ඔබ විසින් මතක තබාගත යුතු අමතර කරුණු කිහිපයක් ද පහතින් දක්වමු.

01. නියෝජිතවරයා නියෝජනය කරනු ලබන්නේ HSBC බැංකුව බවට සනාථ කරගන්න.

02. මුදල් හෝ ඊට සමාන කිසිවක් පිළිගැනීමට නියෝජිතවරුන්ට බලය ලබා දී නොමැති බැවින්, නියෝජිතවරුන් වෙත කිසිදු ගෙවීමක් නොකරන්න.

03. අපගේ සියලුම නියෝජිතවරුන්, බලය ලබාදීමේ ලිපිය (Letter of Authority) හි පිටපතක් ඔවුන් සන්තකයේ තබාගෙන සිටිය යුතු වේ. ඔබගේ අභිමතය පරිදි එම ලිපියෙහි පිටපත දැකබලා ගැනීම පිණිස ඉල්ලා සිටීමේ හැකියාව ඔබට ඇත.

04. නියෝජිතවරයා සම්බන්ධයෙන් ඔබ තෘප්තිමත් නොවේ නම්, අංක 5388100 ඔස්සේ කරුණාකර අප අමතා ඒ බව දන්වන්න. අනතුරුව, හැකි ඉක්මනින් ඔබ සමඟ සම්බන්ධවීමට අප කටයුතු කරනු ඇත.

වැඩි විස්තර සඳහා කරුණාකර ක්‍රෙඩිට් කාඩ්පත් හිමියන් සඳහා වන ගිවිසුම බලන්න.

**CCW/QCG/PRP/2018.06/SIN**